# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,224 — 1964 නොවැම්බර් 12 වැනි බ්‍රහස්පතින්ද — 1964.11.12

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි.)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

ඇල්. ඩී.—බී. 97/41 අංකය : පී. ඇන්. 1783.

### විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා

1948 අංක 13 දරන විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා (සංශෝධන) පනතින් සංශෝධිත 1934 පෙබරවාරි 5 වන දින දරන විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා වල 51 වන වගන්තිය යටතේ නිවේදනය.

ඇන්. ඇම්. පෙරේරා,
මුදල් ඇමති.

1964 නොවැම්බර් 12 වෙනි දින,
කොළඹ දී ය.

### නි වේ ද න ය

1934 පෙබරවාරි 5 වන දින දරන විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා, කලින් කල සංශෝධිත පරිදි, පහත සඳහන් පරිදි තව දුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) 30 වන වගන්තියට ඉක්බිතිව පහත සඳහන් අළුත් වගන්තිය ඇතුළත් කිරීමෙන් :—

" 30අ. (1) මේ ව්‍යවස්ථාවලට පටහැනිව කුමක් සඳහන් වුව ද, එහෙත් මෙහි මින්මතු විධි විධාන සලස්වා ඇති ආකාරයට යටත්ව, රජයේ සේවකයකු හෝ දෛනික වැටුප් ලබන සේවකයකු—

(අ) ඔහුගේ රාජකාරි ඉටු කිරීමේ දී,

(ආ) ඔහුගේ වරදක් නොමැතිව, සහ

(ඇ) ඔහුගේ රාජකාරිවල ස්වභාවයට නිශ්චිත වශයෙන් ම ආරෝපණය කළ හැකි කරුණු හේතුකොටගෙන ලත් තුවාලයක ප්‍රතිඵලයක් වශයෙන් සද සම්පූර්ණ බෙලහීනත්වයට පත් වුව හොත්,

එවිට ඔහුට, ඒ රජයේ සේවකයාගේ හෝ දෛනික වැටුප් ලබන සේවකයාගේ මූලික වැටුපේ හෝ මූලික වේතනයේ තිස් මාසයක වැටුපට හෝ වේතනයට සමාන මුදලක් හෝ රුපියල් දස දහසක් යන දෙකින් කුමක් වැඩි වුව ද, ඒ මුදල, ඔහුගේ බෙලහීනත්වයට පැමිණීම සම්බන්ධයෙන් වන්දියක් වශයෙන් ගෙවිය හැකිය.

(2) රජයේ සේවකයකු හෝ දෛනික වැටුප් ලබන සේවකයකු එවැනි බෙලහීනත්වයට පත්වීම වෙනුවෙන් මේ වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ ගෙවිය හැකි මුදල මේ ව්‍යවස්ථාවල 30වැනි වගන්තිය යටතේ හෝ අවස්ථාවෝචිතව 139 අධිකාරය වන කම්කරු වන්දි ආඥාපනත යටතේ එවැනි බෙලහීනත්වයක් වෙනුවෙන් ගෙවනු ලබන දීමනාවකට අතිරේක වශයෙන් විය යුතුය.

(3) යම් රජයේ සේවකයකු හෝ දෛනිකවැටුප් ලබන සේවකයකු ඒ කාර්‍ය්‍ය සඳහා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් පත් කරනු ලබන, විධිමත් අන්දමින් සමන්විත වූ වෛද්‍ය මණ්ඩලයක් විසින් පරීක්ෂා කොට, (1) වන උප වගන්තියෙහි සඳහන් තුවාලයක් හේතු කොටගෙන ඔහු සද සම්පූර්ණ බෙලහීනත්වයට පත්ව ඇති බවට ලිඛිත වාර්තාවක් නිකුත් කරනු නොලැබුව හොත් ඔහුට මේ යටතේ වන්දි ලැබීමට හිමිකම් නොතිබිය යුතු ය.

(4) තුවාලයක ප්‍රතිඵලයක් වශයෙන් වූ සද සම්පූර්ණ බෙලහීනත්වය වෙනුවෙන් මේ වගන්තිය යටතේ වන්දි මුදලක් හිමි රජයේ සේවකයකු හෝ දෛනික වැටුප් ලබන සේවකයකු වන්දි ගෙවීමට පෙර මිය ගියහොත්, එවිට ඔහුට හිමි වන්දි, එකී රජයේ සේවකයා හෝ දෛනික වැටුප් ලබන සේවකයා තුවාලයක ප්‍රතිඵලයක් වශයෙන් මිය ගිය යේ යැයි සලකා මේ ව්‍යවස්ථා වල 31 ඇ වන වගන්තියෙන් විධි විධාන සලසා ඇති පරිදි ඔහුගේ යැපෙන්නන්ට ගෙවිය යුතුය.

(5) මේ වගන්තියේ කාර්‍ය්‍යයන් සඳහා " සද සම්පූර්ණ බෙලහීනත්වය " යනුවෙන් අදහස් කරන්නේ, එබඳු බෙලහීනත්වයක් පමුණුවන තුවාලය සිදුවන අවස්ථාවේ දී එකී රජයේ සේවකයා ට හෝ දෛනික වැටුප් ලබන සේවකයාට ඉටු කිරීමට පුළුවන් කමක් කුඩු සෑම කාර්යයක් ම කිරීමට නොහැකි වන තත්ත්වයකට ඔහු පත්කරවන තරමේ සද ස්වභාවයක් ගන්නා බෙලහීනතාවය ය.

එසේ වුව ද, ඇස් දෙකේම දෘෂ්ටිය සද සම්පූර්ණයෙන් ම නැති වී යැමත් හෝ මේ ව්‍යවස්ථාවල 31 අ වන වගන්තියෙහි දක්වා ඇති චක්‍රයෙහි නිශ්චිත ව සඳහන් තුවාලවල යම් ඒකාබද්ධ වීමකින්, ඒ චක්‍රයෙහි සඳහන් තුවාලවලට ඉදිරියෙන් නිශ්චිත ව සඳහන් පරිදි, ඉපයීමේ හැකියාව නැතිවීමේ මුළු ප්‍රතිශතය සියයට සියයක් වන අවස්ථාවක, සම්පූර්ණ බෙලහීනත්වය ඇතිවන ලෙස සැලකිය යුතුය.

(6) (53 වන අධිකාරය වන) පොලිස් ආඥාපනත යටතේ පනවනු ලැබූ නියෝග යටතේ බෙලහීනත්වය වෙනුවෙන් වන්දි ලැබීමට හිමි, (පොලිස් රියැදුරකු ද ඇතුළත් ව) යම් පොලිස් නිලධාරියකුකෙරෙහි මේ වගන්තියේ විධි විධාන අදාළ නොවිය යුතුය.

(7) මේ වගන්තිය සියලුම කාර්‍ය්‍යයන් සඳහා, 1964 ජනවාරි මස විසිතුවැනි දින සිට වලංගු වූ ලෙස සැලකිය යුතු ය.

(2) 31 (ආ) වගන්තියට ඉක්බිතිවම පහත සඳහන් අළුත් වගන්තිය ඇතුළත් කිරීමෙන් :—

31 ඇ. (1) මේ ව්‍යවස්ථාවල පටහැනි ව කුමක් සඳහන් වුව ද, මෙහි පහත විධි විධාන සලස්වා ඇති ආකාරයට යටත්ව, රජයේ කිසි සේවකයකු හෝ දෛනික වැටුප් ලබන සේවකයකු—

(අ ) ඔහුගේ රාජකාරි ඉටු කිරීමේ දී,

(ආ) ඔහුගේ ම වරදක් නොමැතිව සහ

(ඇ) ඔහුගේ රාජකාරිවල ස්වභාවය නිශ්චිත වශයෙන්ම ආරෝපණය කළහැකි කරුණු හේතුකොටගෙන ලත් තුවාලයක ප්‍රතිඵලයක් වශයෙන් මිය ගිය හොත්,

ඒ රජයේ සේවකයාගේ හෝ දෛනික වැටුප් ලබන සේවකයාගේ මූලික වැටුපේ හෝ මූලික වේතනයේ තිස් මාසයක වැටුපට හෝ වේතනයට සමාන මුදලක් හෝ රුපියල් දස දහසක් හෝ යන දෙකින් කුමක් වැඩි වුවද ඒ මුදල, පහත සඳහන් පරිදි එකී මරණය වෙනුවෙන් වන්දියක් වශයෙන් ගෙවිය හැකි ය :—

(i) රජයේ සේවකයාට හෝ දෛනික වැටුප් ලබන සේවකයාට වැන්දඹුවක් සහ ළමයින් සිටී නම්, ඒ මුදලින් අඩක් වැන්දඹුවට ද ඉතිරි අඩ, යැපන්නා වූ ළමයින් අතර එක සමානව ද ලැබෙන ලෙස අනුපාතිකව ගෙවිය යුතුය.

(ii) රජයේ සේවකයාට හෝ දෛනික වැටුප් ලබන සේවකයාට යැපෙන්නා වූ ළමයින් නොමැතිව වැන්දඹුවක් පමණක් සිටී නම්, සම්පූර්ණ මුදල ඒ වැන්දඹුවට ගෙවිය යුතුය.

(iii) රජයේ සේවකයාට හෝ දෛනික වැටුප් ලබන සේවකයාට වැන්දඹුවකු නොමැති ව, යැපෙන්නා වූ දරුවකු හෝ දරුවන් සිටී නම්, ඒ මුදල් එකී දරුවාට හෝ දරුවන්ට එක සමාන කොටස් වලින් ගෙවිය යුතුය.

(iv) රජයේ සේවකයාට හෝ දෛනික වැටුප් ලබන සේවකයාට වැන්දඹුවකුවත්, යැපෙන්නා වූ කිසිම දරුවකු වත් නොමැත්තේ නම්, ඒ මුදල භාණ්ඩාගාරයේ ලේකම් විසින් තීරණය කරනු ලබන ආකාරයකින්, මිය ගිය තැනැත්තාගේ වෙන යම් යැපෙන්නකුට හෝ යැපෙන්නන්ට ගෙවිය යුතුය.

2. මේ වගන්තිය යටතේ රජයේ සේවකයකුගේ හෝ දෛනික වැටුප් ලබන සේවකයකුගේ හෝ මරණය වෙනුවෙන් ගෙවනු ලබන මුදල, අවස්ථාවෝචිතව මේ ව්‍යවස්ථාවල 31 වන වගන්තිය යටතේ, ඒ රජයේ සේවකයා හෝ දෛනික වැටුප් ලබන සේවකයා වෙනුවෙන් ගෙවනු ලබන යම් විශ්‍රාම වැටුපකට හෝ වැටුප් වලට හෝ 139 වන අධිකාරය වන කම්කරු වන්දි ආඥාපනත යටතේ ගෙවනු ලබන දීමනාවලට අතිරේක වශයෙන් විය යුතු ය.

3. මේ වගන්තියේ කාර්‍යයන් සඳහා ''දරුවා'' යන යෙදුමට සුළු දරුවෙක් හෝ නීතිය විසින් පිළිගත්තා වූ විධියකින් දරු බවට හදා ගත්තා වූ හදගත් දරුවෙක් ඇතුළත් විය යුතු ය.

4. (53 වන අධිකාරය වන) පොලිස් ආඥාපනත යටතේ පනවනු ලැබූ නියෝග යටතේ මරණය වෙනුවෙන් වන්දි ගෙවනු ලබන, (පොලිස් රියැදුරකු ද ඇතුළත් ව) යම් පොලිස් නිලධාරියකු කෙරෙහි මේ වගන්තියේ විධි විධාන අදාළ නො විය යුතු ය.

5. මේ වගන්තිය, සියලුම කාර්‍යයන් සඳහා 1964 ජනවාරි මස විසි නවවැනි දින සිට වලංගු වූ ලෙස සැලකිය යුතුය.

11–587

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි "ඊස්වර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි